# ශ්‍රී ලාංකේය සමාජයේ නූතනත්ව ප්‍රවේශය : නූතන සිංහල ප්‍රබන්ධ ආශ්‍රිත විමර්ශනයක්

ආචාර්ය කුමුදු කරුණාරත්න රණවීර

**Abstract:**

Due to the socio-economic transformation that took place in the country during the colonial era, the traditional social institutions that had been active in the country until then were replaced. Accordingly, the development of a new socio-economic system as a result of the new social institutions and its activities was largely completed during the British rule. That is, the modern era of Sri Lankan history began in the early nineteenth century. This study examines how the reality of Sri Lankan society's entry into modernity is recreated in contemporary Sinhala fiction. The theory here is based on the methodology of the study of Sociology of Literature, as well as the theory of Marxist literature, as well as the Subaltern study approach. Data analysis was performed according to the qualitative data analysis methodology. The new cities that emerged as industrialization and urbanization, or modernization, became the centre of vast

centres such as businesses and government institutions in the country, and as a whole they had the potential to influence all aspects of people's lives. On the one hand, the modern literature that emerged in Sri Lanka as a result of the colonial process was completely different in content as well as ideology from the pre-colonial literature. This modern literature recreated a set of new social experiences and examined how Sinhala fiction was able to reliably recreate reality.

**Keywords:** *Industrialization, Modernity, Pre-Colonial Society, Colonial Society, Sinhala Fiction*

**යතුරු පද :** කාර්මීකරණය, නූතනත්වය, පූර්ව යටත්විජිත සමාජය, යටත්විජිත සමාජය, සිංහල ප්‍රබන්ධ

## හැඳින්වීම :

සාහිත්‍යය යනු හුදු නිර්මාණාත්මක ක්‍රියාවලියක් පමණක් නොව සමාජ ප්‍රතිබිම්බන ක්‍රියාවලියක් ද වේ. සමාජයීය සාහිත්‍ය අධ්‍යයන මාර්ගය **(Sociology of Literature)** අනුව කෘතියෙහි අන්තර්ගතය තත්කාලීන සාමූහික විඥානයේ පර්යාවලෝකනයක් සේ සැලකෙන බැවිනි **(Goldmann,1975:160)**. සාහිත්‍ය කලා හුදු ආකස්මික ප්‍රපංචයක් හෝ නිර්මාණකරුවාගේ කේවල මනෝභාවයන් නිරූපණය කරන්නක් නොව ඒවා බිහි වූ යුගයේ සමාජ සංස්කෘතික පදනමෙහි පිළිබිඹුවක් වන බව සාහිත්‍යවේදීන්ගේ මෙන්ම සමාජ හා මානව විද්‍යාඥයන්ගේ ද පිළිගැනීමයි **(සුරවීර,1982:18,21,30)**. ඒ අනුව කිසියම් සමාජයක නිශ්චිත කාල වකවානුවක රචිත සාහිත්‍ය කෘති මගින් එම යුගය විශ්වසනීයත්වයෙන් හා තත්වානුරූපීව නිරූපණය වන්නේදැයි විමර්ශනය කළ හැකිය. අදාළ යුගයෙහි එකී සමාජයේ ක්‍රියාත්මක වන සමාජ සංස්ථා හඳුනා ගැනීමෙන් සංස්ථාපිත සමාජය විග්‍රහ කර ගත හැකිය.

එකුන් විසිවන සියවසේ ලාංකේය සමාජ ව්‍යූහයේ සිදු කෙරුණු ප්‍රතිසංස්කරණ හේතු කොටගෙන මෙරට සමාජය නූතනත්වය අත් කර ගැනීමෙහි සමත් විය. බටහිර අධිරාජ්‍යවාදී පාලකයන් යටතේ ආරම්භ වූ සමාජ ආර්ථික ක්‍රමයක වර්ධනය බොහෝ දුරට පූර්ණත්වයට පත්

වූයේ බ්‍රිතාන්‍ය පාලන සමයෙහිදීය. ඒ අනුව දහනවවන සියවස මුල් භාගයේ දී මෙරට ඉතිහාසයේ නූතන යුගය ආරම්භ වූ සේ පිළිගැනේ (**De Silva, 1881 : 244**, වික්‍රමසිංහ, 2012 : 185).

පෘතුගීසීන්ගේ ආගමනයෙන් පසුව මෙරට වෙරළබඩ තීරයෙහි ක්‍රියාත්මක වූ යුරෝපීය වාණිජවාදී අර්ථක්‍රමය ලංකාවාසීන් තුළ මූල්‍යමය විඥානයක් ඇති කරවීමෙහි මෙන්ම දේශීය ප්‍රභූ ස්තරය තුළ ඉඩම් හුවමාරු රටාවක් ජනිත කිරීමෙහි ද හේතු විය. එසේ වුවද මේ වාණිජ වටිනාකම මත ඉඩම් විකිණීමේ ක්‍රමය සාම්ප්‍රදායික සමාජ ව්‍යූහය පූර්ණ වශයෙන් විපර්යාසයට ලක් කිරීමෙහි සමත් නොවුණි **(Bandarage (1982) 1985 : 83)**. මේ ද්විත්ව අර්ථ ක්‍රමය හේතුවෙන් මෙරට සමාජාර්ථික පරිස්ථිතියෙහි ඇති වූ ගැටලුව වර්ෂ 1833 කෝල්බෲක්-කැමරන් ප්‍රතිසංස්කරණවලින් නිදහස් ආයෝජන පක්ෂයට ජය අත්වීමෙන් විසඳුණි. මේ මගින් සිදුවූයේ මෙරට ධනේශ්වර සමාජ ක්‍රමය සඳහා නෛතික, දේශපාලනික සහ විඥානමය පසුබිම සකස් කරමින් සිංහල සමාජය මත ධනේශ්වර පන්ති සම්බන්ධතා ආරෝපණය කිරීමකි (ද සිල්වා, 1970:406-410).

මෙසේ දහනවවන සියවසෙහි මෙරට සමාජයෙහි සිදු වූ විපරිවර්තනය ලාංකේය සමාජය නූතනත්වයට පත් කිරීමේ ප්‍රවේශය ගොඩනැඟීය. මෙම සමාජ වෙනස්වීම් තත්කාලීන සිංහල ප්‍රබන්ධකරුවන්ගේ අවධානයට යොමුව ඇති ආකාරයත්, එකී සමාජ යථාර්ථය ප්‍රතිනිර්මාණය කිරීමෙහිලා ඔවුන්ගේ ශක්‍යතා සහ සීමාවනුත් හඳුනා ගැනීම මේ ලිපියේ අරමුණයි.

**පර්යේෂණ ගැටලුව :**

යටත්විජිත යුගයෙහි මෙරට සමාජ ව්‍යූහයේ සිදු කෙරුණු ප්‍රතිසංස්කරණ හේතුවෙන් ඇති වූ ලාංකේය සමාජය නූතනත්වයට එළැඹීම තත්කාලීන ප්‍රබන්ධවලින් නිරූපණය වන්නේ කෙසේද?

**පර්යේෂණ අරමුණු :**

19 වන සියවසෙහි මෙරට සිදු වූ සමාජ විපරිවර්තනය හේතුවෙන් සිදු වූ නූතනත්ව ප්‍රවේශය තත්කාලීන ප්‍රබන්ධවලින් නිරූපණය වේදැයි විමසීම.

ලාංකේය සමාජය නූතනත්වයට ප්‍රවේශ වීම හේතුවෙන් මෙරට සමාජයේ සිදු වූ නවීකරණය හා කාර්මීකරණය වැනි ධනේශ්වර සමාජ ක්‍රියාකාරකම්වල ස්වභාවය සිංහල ප්‍රබන්ධ කතාවෙහි ප්‍රතිනිර්මාණය වන්නේ කුමනාකාරයෙන් දැයි විමර්ශනය කිරීම.

## පර්යේෂණ ක්‍රමවේදය :

මූලික වශයෙන් සාහිත්‍යමය මූලාශ්‍රය මත පදනම් වූ අධ්‍යයනයක් වන මේ සඳහා වර්ෂ 1866 සිට 1925 දක්වා සිංහල ප්‍රබන්ධ කතාවෙහි ආරම්භක යුගයට අදාළ ප්‍රබන්ධ ප්‍රාථමික මූලාශ්‍රය වෙයි. අධ්‍යයනයට අදාළ මූලික න්‍යාය ලෙස සමාජීය සාහිත්‍ය අධ්‍යයන න්‍යායත්, මාක්ස්වාදී න්‍යාය සහ පශ්චාත් යටත්විජිත න්‍යායික ප්‍රවේශය මෙන්ම නිර්ප්‍රභූ අධ්‍යයන ප්‍රවේශය ද අවශ්‍ය පරිදි භාවිත කෙරේ. දත්ත විශ්ලේෂණය සඳහා ගුණාත්මක දත්ත විශ්ලේෂණ විධි ක්‍රමය ඉවහල් කොට ගැනුණි.

## සාහිත්‍ය විමර්ශනය :

අපගේ අධ්‍යයනයට අදාළ යුගයෙහි සමාජාර්ථික මෙන්ම දේශපාලනික පසුබිම සම්බන්ධයෙන් සිදු කෙරී ඇති පූර්ව අධ්‍යයන කිහිපයක් කෙරෙහි අවධානය යොමු කරනු ලැබේ. කොල්වින් ආර්. ද සිල්වා විසින් 1941 දී ප්‍රකාශයට පත් කරන ලද **'Ceylon Under the British Occupation (1795-1833)**. කෘතිය මූලික වශයෙන් මෙරට බ්‍රිතාන්‍ය පාලනයේ ආරම්භක යුගය සම්බන්ධයෙන් සිදු කරන ලද පර්යේෂණයකි. මෙරට බ්‍රිතාන්‍යය පාලන සමය හා සම්බන්ධ 1795 සිට 1833 දක්වා වූ කාල පරාසයේ මෙරට දේශපාලන, පරිපාලන හා ආර්ථික අංශයන්හි බ්‍රිතාන්‍ය මැදිහත්වීම් පිළිබඳ සවිස්තරාත්මක අධ්‍යයනයක් මෙහි ඉදිරිපත් කොට තිබේ. සාම්ප්‍රදායික අර්ථ ක්‍රමය වෙනස්වීමත් අභිනව නීති පද්ධතියක් හඳුන්වා දීමත් හේතුවෙන් මෙරට සමාජාර්ථික තත්වයෙහි කිසියම් වෙනසක් ඇති කිරීමෙහි ආරම්භක පියවරක් තැබූ යුගයක් පිළිබඳ අධ්‍යයනයක් වීම හේතුවෙන් එකී වෙනස්වීම් පෘථුල ලෙස ප්‍රකාශයට පත් වූ යුගය ඇසුරෙන් සිදු කෙරෙන මෙම අධ්‍යයනයට පසුබිම සකසා ගැනීම සම්බන්ධයෙන් මෙම අධ්‍යයනය ඉවහල් විය.

ඩබ්ලිව්.එම්.ඩී.ඩී. අන්ද්‍රාදිගේ **'Sri Lankan Subordinates of the British (Andradi : 2011)** නමැති පර්යේෂණ කෘතිය මෙරට බ්‍රිතාන්‍ය පාලනය යටතේ පැවති වසර විස්සක් පාදක කොට ගත්තකි. මේ මගින් මෙරට ඉංග්‍රීසි උගත් ලාංකිකයන් විවිධ වෘත්තීන් මගින් බ්‍රිතාන්‍ය පාලනයට සම්බන්ධ වූ ආකාරය විමසා බැලෙන අතර පරිපාලන වාර්තා, සංගණන වාර්තා ආදි වූ මූලාශ්‍රය භාවිත කොට තිබේ. පරිපාලන සේවය, නීති අංශය, ලිපිකරු සේවය, මහජන වැඩ දෙපාර්තමේන්තුව, දුම්රිය හා වෙනත් කාර්මික සේවා, වෛද්‍ය සේවය හා පාසල් සම්බන්ධ තනතුරු ආදිය මගින් නවීකරණය වූ සමාජයේ ක්‍රියාකාරීත්වය විමසා බැලෙයි. මෙසේ වෘත්තිය හා බැඳි ආර්ථික හා සමාජ තත්ව සහිත අභිනව සමාජ කොටස් බිහිවීම එතෙක් පැවති තත්වයෙහි කිසියම් විපර්යාසයක් ඇති කිරීමෙහි සමත් විය. ඒ අනුව සමාජ විචල්‍ය පිළිබඳ අභිනව තත්ව අධ්‍යයනය මගින් මෙරට සමාජය නූතනත්වයට පත්වීමෙහි ක්‍රියාවලිය නිරීක්ෂණයෙහි අවකාශ ලබා දෙන අධ්‍යයනයක් ලෙස මෙකී ග්‍රන්ථය වැදගත් වේ.

අපගේ අධ්‍යයනයට අදාළ යුගය නියෝජනය කරමින් මෙරට යටත්විජිත සමාජාර්ථික තත්වය විමර්ශනයට ලක් කළ කෘතියක් ලෙස අශෝකා බණ්ඩාරගේගේ **'ශ්‍රී ලංකාවේ යටත්විජිතවාදය'** කෘතිය ද වැදගත් වේ. බ්‍රිතාන්‍ය වතු වගා ආර්ථිකය හා යටත්විජිත දේශපාලන අධිකාරිය ලංකාවේ උඩරට ප්‍රදේශවලට බලපෑ ආකාරය මෙමගින් අධ්‍යයනය කර තිබේ. බ්‍රිතාන්‍ය ආණ්ඩුව හා කඳුරට සමාජය ආරම්භක සම්බන්ධතා ඇති කරගත් කාලය වන 1833-1886 අතර වූ අඩ සියවසක කාල පරිච්ඡේදය මෙම අධ්‍යයනයට පසුබිම් වෙයි. මෙය බ්‍රිතාන්‍ය දේශපාලන අධිකාරිය ක්‍රමානුකූලව මුල් බැසගත් මෙන්ම වතු ආර්ථිකය ස්ථිර පදනමක් මත ස්ථාපිත වූ කාලය ද වේ. එමෙන්ම අමුද්‍රව්‍ය නිෂ්පාදකයකු ලෙස ලංකාව ධනවාදී ලෝක ආර්ථිකයට ඇතුළත් වූයේ ද මෙම කාල පරිච්ඡේදයේ දීය **(බණ්ඩාරගේ 2005 : 21).** දහනව වන ශතවර්ෂයේ උඩරට පැවති දේශීය ආර්ථිකයත් අභිනව දේශපාලන, ආර්ථික ව්‍යූහයත් අතර අන්තර්කරණයක් පිළිබඳව ඉදිරිපත් කරන ලද නිශ්චිත ඓතිහාසික තොරතුරු සංශ්ලේෂණය කිරීමෙන් අනතුරුව විවිධ න්‍යායාත්මක දෘෂ්ටිකෝණවලින් ඇගයීමට ලක් කිරීමත් හේතුවෙනි.

ශ්‍රී ලාංකික ධනේශ්වරයක් බිහිවීමට පාදක වූ සමාජාර්ථික මෙන්ම දේශපාලනික හේතු විමර්ශනය කරමින් 1830-1940 දක්වා කාල පරාසය අළලා කුමාරි ජයවර්ධන විසින් රචිත **'සොක්කන් ලොක්කන් වූ වගයි'** කෘතිය ද අප අධ්‍යයනය සම්බන්ධ වැදගත් වන්නා වූ සමකාලීන / පූර්ව අධ්‍යයනයකි. මේ මගින් බ්‍රිතාන්‍ය පාලන අවධියෙහි මෙරට නව ධනේශ්වරයේ ප්‍රභවය හා වර්ධනය සිදු වූ ආකාරය විභාග කෙරේ. ඒ අනුව මෙරට ධනපති ක්‍රමයේ ස්වභාවය, දේශීය ධනේශ්වරය ඒකරාශී කර ගත් ආරම්භක ප්‍රාග්ධනයේ ස්වභාවය හා නව පංතියේ කුල, ජනවාර්ගික, ආගමික හා ස්ත්‍රී-පුරුෂ සංයුතිය මෙන්ම සමාජ තරාතිරම, අනන්‍යතාව, දේශපාලන බලය සහ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිය මෙන්ම ඊට වූ උනන්දුව ද විමසා බලයි. අභිනව ප්‍රාග්ධන හිමියන්ගේ බිහිවීමත් සමගම කුලය මත පදනම් වූ පැරණි ශ්‍රම විභජනය අභියෝගයට ලක් වූ ආකාරය ද මෙහි දී විමර්ශනය කෙරේ. සමස්තයක් ලෙස ගත් කල බ්‍රිතාන්‍ය යුගයෙහි මෙරට සිදු වූ සමාජාර්ථික පරිවර්තනය සම්බන්ධයෙන් වූ පෘථුල විග්‍රහයක් වීම මෙන්ම මාක්ස්වාදී න්‍යාය ඇසුරෙන් යටත්විජිත ලංකාවේ සමාජාර්ථික විපරිවර්තනය විශ්ලේෂණය කිරීමේ විද්‍යාත්මක ප්‍රවේශයකට ප්‍රවිෂ්ට වීම හේතුවෙන් ද මෙම අධ්‍යයනය වැදගත් වේ.

හේමා ගුණතිලක විසින් රචිත **"The Rise of the Sinhala Novel and the Changing Socio-Economic Structure:** Kalyani Journal of Humanities & Social Sciences of the University of Kelaniya, නම් ශාස්ත්‍රීය සඟරාවේ ප්‍රකාශයට පත් විය. 1866 සිට 1910 දක්වා මෙරට ප්‍රබන්ධකරණයේ නියුතු ප්‍රධාන නිර්මාණකරුවන්ගේ නිර්මාණ ඇසුරෙන් සිදු කළ මෙම අධ්‍යයනයෙහි දී අයිසැක් ද සිල්වා, කන්නන්ගර දේවගැතිතුමා, බෙන්තොට ඇල්බට් සිල්වා, සයිමන් ද සිල්වා, එම්.සී.එෆ්. පෙරේරා සහ පියදාස සිරිසේන යන ලේඛකයන් කතුවරියගේ අවධානයට ලක්වී තිබේ. බ්‍රිතාන්‍ය පාලනයත් සමග මෙරට ඇති වූ සමාජාර්ථික විපරිවර්තනය පසුබිම් කොට ගෙන නව්‍ය මාර්ගයක වර්ධනය වෙමින් විකාශනය වූ නූතන සිංහල ප්‍රබන්ධ සාහිත්‍ය යුගය කොටස් තුනකට බෙදා දක්වමින් කතුවරුන්ගේ ජීවන හා සමාජ පසුබිම නිර්ණය කොට ගැනීම මෙහි කැපී පෙනෙන ලක්ෂණයකි.

**පසුබිම :**

**නූතනත්වය :**

නූතනත්වය යනුවෙන් හැඳින්වෙන්නේ මානව ඉතිහාසයේ සුවිශේෂී යුගයක් පිළිබඳවයි. එය විද්‍යාත්මක චින්තනයේ පුද්ගලවාදය, කාර්මීකරණය සහ තාක්ෂණික සංවර්ධනය කෙරෙහි අවධානය යොමු කිරීම සහ ඇතැම් සාම්ප්‍රදායික සාරධර්ම ප්‍රතික්ෂේප කිරීම මගින් සංලක්ෂිත වූ යුගයකි **(https://www.tutorzu.net>sociology>topies> modernity 2021.03.29)**. නූතනත්ව ක්‍රියාවලිය ක්‍රමයෙන් භාවිතාවට අවතීර්ණ වූයේ යුරෝපය වාණිජකරණයේ ඔබ්බට ගමන් කොට ආසියාවේ, අප්‍රිකාවේ, ලතින් ඇමෙරිකාවේ ධන සම්පත් හා මිනිස් ශ්‍රමය කොල්ලකමින් ඒවා ආධාරයෙන් ස්වකීය මහද්වීපයේ ධනවාදය ගොඩනගා තහවුරු කිරීමේ ක්‍රියාවලිය ක්‍රමයෙන් ආරම්භ වීමත් සමගය. ඒ අනුව නූතනත්වය යනු අපරදිග සම්පාදනය වී පෙරදිගට පැමිණි ක්‍රියාවලියකි **(දෝෂි, 2007:03)**. නූතනත්වය යන්නෙහි සමාන්‍ය අර්ථය කාර්මීකරණයයි. කාර්මීකරණය යන්නෙන් නව සොයා ගැනීම්, මහාපරිමාණ නිෂ්පාදන හා නව නිෂ්පාදන යන්න අර්ථ ගැන්වේ **(දෝෂි, 2016:25)**. මේ අනුව නූතනත්වය සාමාන්‍යයෙන් අර්ථ දක්වනුයේ පශ්චාත් සාම්ප්‍රදායික අවධිය ලෙසයි. මේ අනුව වැඩවසම් ක්‍රමය හෝ කෘෂිකාර්මිකභාවයෙන් මිදී ධනවාදය, කාර්මීකරණය, සබුද්ධීකරණය හා ජාතික රාජ්‍ය යන තත්ව හා ආයතන ඇසුරින් නූතනත්වය ස්ථාපනය විය **(Barker, 2005 : 444).**

නූතන සමාජය නැතහොත් කාර්මික ශිෂ්ටාචාරය යන යෙදුම් කෙටි වුවද සුවිශාල සිතුවමක් මැවීමට සමත් වේ. එය ලෝකය පිළිබඳ ආකල්ප සමූහක් හා සම්බන්ධ වේ. ලෝකය මිනිස් මැදිහත් වීමෙන් වෙනස් කළ හැකිය යන ආකල්පය එහි ප්‍රධාන වේ. එමෙන්ම එය ආර්ථික ආයතන සමූහයක් සමග ද සම්බන්ධ වේ. කාර්මික නිෂ්පාදන හා වෙළඳපොළ ආර්ථිකය ඒ හා සම්බන්ධ වේ. එමෙන්ම දේශපාලන ආයතන සමූහයක් ද ඊට සම්බන්ධ වේ. මේ ලක්ෂණවල ප්‍රතිඵලයක් වශයෙන් නූතනත්වය පූර්ව සමාජ ක්‍රමවලට වඩා ගතිකත්වයකින් යුතු වේ. එය වඩා තාක්ෂණික වූ, වඩා සංකීර්ණ වූ ආයතනවලින් සුසැදි සමාජයකි. එය අතීතය දෙසට වඩා අනාගතය දෙසට යොමු වූ සමාජ ක්‍රමයකි **(Giddens, 1998 : 94)**.

සීමිත තාක්ෂණික වර්ධනයකින් යුක්ත සාම්ප්‍රදායික සමාජවල බහුතර ජනයා කෘෂිකර්මාන්තයෙන් ජීවත්වූහ. මේ සාම්ප්‍රදායික සමාජයෙහි ද නගර තිබුණ ද ඒවා හුදෙක් පරිපාලන කේන්ද්‍ර හෝ වෙනත් ඓතිහාසික වැදගත්කමකින් යුතු ඒවා විය. කාර්මීකරණය රැකියා උත්පාදකයක් වීම හේතුවෙන් ඒ වන විට බිහි වී තිබූ නගර පූර්ව තත්වය අතික්‍රමණය කරමින් කාර්මීකරණය හා නාගරීකරණය මගින් අභිනව ස්වරූපයෙන් යුත් නගර ලෙස ගොඩනැගුණි **(දෝෂි, 2007 : 04).** මෙසේ ගොඩනැගුණු නව නගරවල රැකියා අවස්ථා නිර්මාණය වීමේ වේගය ශීඝ්‍ර වූ අතර එහෙයින්ම නාගරීකරණ ලක්ෂණ ද ප්‍රකට විය. කාර්මීකරණය විසින් ප්‍රවාහනයත්, සන්නිවේදනයත් සහස්‍රීකරණයට ලක් කළේය. අනිත් පසින් නූතනත්වයේ ගමන් සගයා වූයේ ධනවාදයයි. මේ අනුව කාර්මීකරණය, නාගරීකරණය සහ ධනවාදය ඇසුරෙන් ලාංකේය සමාජය නූතනත්වයට ප්‍රවේශ වූයේ බ්‍රිතාන්‍ය පාලන සමයේදීය. ඊට පූර්වයෙන් මෙරට ක්‍රියාත්මක වූයේ මධ්‍යකාලීන වැඩවසම් ක්‍රමයයි. යටත්විජිත සමාජ විග්‍රහයේ දී පූර්ව යටත්විජිත සමාජයට සාපේක්ෂ වශයෙන් මෙකී ලක්ෂණ ප්‍රකට කළ යුගය මෙරට නූතනත්වය අත්විඳි යුගයයි.

**ලාංකේය සමාජය සහ නූතනත්වය :**

ක්‍රි.පූ. 5 වන සියවසේ පමණ ආර්යයන්ගේ පැමිණීමත් සමගම ඔවුන්ගේ සමාජ සංස්ථා, සංවිධාන හා චාරිත්‍ර මෙන්ම සමාජ උසස් පහත් බව සම්බන්ධ ඇගයීම් ද මෙරට ස්ථාපනය විය **(එල්ලාවල,1969:11).** වර්ෂ 1905 දී පෘතුගීසීන් මෙරට මුහුදුබඩ ප්‍රදේශ ස්වකීය අණසකට යටත් කර ගන්නා තෙක්ම සමස්තයක් වශයෙන් මුළු රටම සම්ප්‍රදායානුගත සමාජයක් ලෙස පැවතුණි. එනම් ප්‍රාග් යටත්විජිත ලංකාවේ පැවති කෘෂිකර්මය හා වාරිමාර්ග ක්‍රම පදනම් කර ගත් ශිෂ්ටාචාරය සාම්ප්‍රදායිකත්වය හා බැඳී පැවතුණි. රාජ්‍ය පාලනය යටතේ රජුගේ බලය අසීමිත වූවකි. එහෙත් ඔහුගේ පාලනය සම්බන්ධ කටයුතු පෙර සිරිත් අනුව ඉටු කිරීම අවශ්‍ය වූවකි **(ද සිල්වා,1981:45).** එපමණක් නොව සමස්ත සමාජ ජීවිතයෙන් ද සාම්ප්‍රදායිකත්වය විද්‍යමාන විය. ආර්ථික ජීවිතය පාරම්පරික කෘෂිකර්මය මත රැඳුණි. මහනුවර යුගය වන විට වඩා පැහැදිලිවම සාම්ප්‍රදායික කෘෂි අර්ථ ක්‍රමය වැඩවසම් රාමුව මගින් වඩා ශක්තිමත් විය. සේවා වෙනුවෙන් ගෙවීම් කරනු

ලැබුවේ මුදලින් නොව ඇතැම් අවස්ථාවල දී භාණ්ඩ හා ඉඩම්වලිනි. වැඩවසම් ක්‍රමය යටතේ සෑම පුරවැසියෙකුම රජතුමා හා ප්‍රබුද්ධ ජනයා වෙනුවෙන් රාජකාරි කිරීම අනිවාර්ය විය. මෙය කුල පදනම අනුව සකස් වී තිබුණි. ඒ ඒ කුලයට අයත් කාර්යය නිර්වචනය වී තිබුණි. (කුමාරස්වාමි, 1964:20-24, **Thambiah,** 1963:66). කුමන තත්වයක් යටතේ වුවද ඉඩම් සාම්ප්‍රදායික සමාජයේ ප්‍රධාන ජීවනෝපාය මාර්ගය වූ අතර ඉන් ඉපැදුණු ආදායම රජයේ ප්‍රධාන ආදායම් මූලය වේ (ආරියපාල,1962:320).

මේ අනුව පෘතුගීසීන් ලංකාවට පැමිණෙන විට කුල ක්‍රමය හා සබැඳි වැඩවසම් ක්‍රමයක් මෙන්ම රාජ්‍යත්වය හා බුදු දහම මගින් තීරණය කරන ලද සාම්ප්‍රදායික සමාජයක් පැවතුණි **(Fernando, 1979 : 29, Wickramasinghe, 1995:17)**. පෘතුගීසි, ලන්දේසි පාලන කාලයට සාපේක්ෂව ඉංග්‍රීසි පාලන සමයේ දී මෙරට සම්ප්‍රදායානුගත සමාජය ක්‍රමයෙන් වෙනස් වීමට ලක් විය. බ්‍රිතාන්‍යයන්ගේ දේශපාලන, ආර්ථික හා නෛතික ප්‍රතිපත්ති මධ්‍යගත කොටගත් නවීකරණය හේතුවෙන් තත්කාලීන සමාජය වෙනස්වීම්වලට විවෘත විය. සමාජ විපරිවර්තන කාරකයක් ලෙස 'නවීකරණය' සුවිශේෂ වන අතර ඒ මගින් විශේෂිත වෙනස්වීම් සිදුවන ක්‍රියාවලියක් මෙන්ම, පුද්ගලයන් අතර සහයෝගීත්වය මගින් ස්වභාවධර්මය පුළුල් ලෙස පාලනය කෙරෙයි **(Rustow, 1967 : 5-8)**. මේ අනුව සමාජ ජීවිතයේ සෑම අංශයකම ඇති වන අඛණ්ඩ වෙනස්වීම් ක්‍රියාවලිය නවීකරණය ලෙස හැඳින්වේ **(Eisesnstadt, 1966 : 18).** සමාජයක ජීවත්වන පුද්ගලයන්ගේ ජීවන රටාව හා ඔවුන්ගේ වැඩ කටයුතුවල සිදුවන සංකීර්ණ වෙනස්වීම් ජාලය නවීකරණය ලෙස ගැනෙන අතර වැටුප් ශ්‍රම බලකායේ වර්ධනය, මූල්‍ය වෙළඳපොළක් ඇතිවීම, සම්ප්‍රදායානුගත විශ්වාස හා ආකල්ප වෙනස්වීම් ආදියෙන් එය සමන්විත වේ **(Kearney, 1999: 57)**.

බ්‍රිතාන්‍යයන් විසින් මෙරට ඇති කරන ලද වතු වැවිලි අර්ථ ක්‍රමය මගින් ඇති වූ වෙනස්කම් මෙරට නවීකරණයේ මාවතට ප්‍රවේශ වීමේ ප්‍රබල සාධකයකි. ලංකාවේ ආර්ථික තත්වය කාර්මික එකක් බවට පෙරළීමේ මුල පිරුණේ වතු වැවිලි අර්ථ ක්‍රමය ඇරඹීමත් සමගය. අපනයනය කෙරෙන ප්‍රධාන වෙළෙඳ ද්‍රව්‍ය සකස් කිරීමෙහිලා මුල් පියවර ගනු ලබන්නේ වතුවලම හෝ ඒවා සමීපයෙහිය (ඔලිවර්, 1963 : 156). 1880-1910 අතර කාලයෙහි බෙහෙවින් වර්ධනය

වූ වතු වගාව දේශීය කර්මාන්තය අභිභවා වැවිලි අර්ථ ක්‍රමය ව්‍යාප්ත වීමෙන් රට නව මගකට යොමුවීමේ අවකාශ විවර වූ අතර වතු අර්ථ ක්‍රමයට සරිලන ශ්‍රම බලකායක් රට අභ්‍යන්තරයෙන් සපයාගත නොහැකිවීමෙන් අඩු කුලියට දකුණු ඉන්දියානු වැටුප් ශ්‍රමිකයන් ගෙන්වා ගත් අතර මුදල් හුවමාරු අර්ථ ක්‍රමයක් ක්‍රමයෙන් ස්ථාපිත විය. ලංකාවේ බැංකු ක්‍රමයක ආරම්භය ඇති වීමට බලපෑම් කරන ලද්දේ වතු වගාවේ සංවර්ධනයත්, ඊට සමාන්තරව වැඩුණු ආයාත වෙළෙඳ කටයුතුය. වතුකරයේ අවශ්‍යතා හා ආයාත වෙළෙඳ කටයුතු සඳහා අවශ්‍ය මුදල් සැපයීමට ද විදේශීය ලැබීම් හුවමාරු කිරීමේ අතරමැදි කටයුතු ඉටු කිරීම සඳහා ද බැංකුවල අවශ්‍යතාව පැනනැගුණි **(බණ්ඩාරගේ, 2007 : 115 - 116).** මෙකී වැවිලි අර්ථ ක්‍රමයෙහි ප්‍රතිඵලයක් ලෙස දුම්රිය හා මහාමාර්ග ව්‍යාප්ත වීමත්, මුද්‍රණ ශිල්පය වර්ධනය වීම, මෝටර් රථ ප්‍රවාහනය ඇරඹීම, දූරකථන හා විදුලි පණිවුඩ සේවා ව්‍යාප්තියත් සමග ප්‍රධාන නගරය හා ප්‍රත්‍යන්ත ප්‍රදේශ අතර සබඳතා වර්ධනය වීම සාම්ප්‍රදායික සමාජ අනන්‍යතා ව්‍යර්ථ කිරීමෙහි හේතු විය.

ඉංග්‍රීසි භාෂාව පදනම් කොටගත් බටහිර අධ්‍යාපන ක්‍රමය මෙරට සැලකිය යුතු සමාජ-සංස්කෘතික හා ආර්ථික විපරිවර්තනයකට හේතු විය. එතෙක් සාම්ප්‍රදායික සමාජයෙහි ක්‍රියාත්මක වූ දේශීය භාෂාව, කාව්‍ය ශාස්ත්‍රය, ආයුර්වේද ආශ්‍රිත විෂයයන් උගන්වන ආරාමික මධ්‍යස්ථාන වෙනුවට වඩාත් ලෞකික විෂයක්ෂේත්‍ර ආශ්‍රිත අධ්‍යාපනයක් ලබාදීමෙහිලා අභිනව පාසල් පද්ධතියක් ගොඩනැගීම ඉංග්‍රීසීන්ගේ අභිප්‍රාය විය. ඒ අනුව ඉංග්‍රීසි, ග්‍රීක්, ලතින් වැනි භාෂාත් ගණිතය වැනි විද්‍යාත්මක විෂයනුත් හඳුන්වා දුන් අතර අවසන නව අධ්‍යාපන ක්‍රමයේ ප්‍රතිඵල ලෙස නව සමාජ ස්තරායන රටාවක් ගොඩනැගුණි. ඉංග්‍රීසි අධ්‍යාපනයෙන් ඵල ලැබූවන්ට රජයේ උසස් තනතුරු සඳහා අවකාශ විවෘත වූ අතර ඉංග්‍රීසි අධ්‍යයන අවස්ථා අහිමි වූ බහුතරයක් ද බිහිවිය **(Wriggins, 1980 : 30)**. ඒ අනුව විසිවෙනි සියවසෙහි ආරම්භක යුගයේ මෙරට එතෙක් උසස් යැයි සම්මත වූ කුල සාමාජිකයන් මෙන්ම අවශේෂ කුල සාමාජිකයෝ ද අධ්‍යාපනය ලැබූ ප්‍රබුද්ධයෝ අතර කැපී පෙණුනහ **(Fernando, 1979 : 33-34).** ඒ අනුව මෙතෙක් පැවති සාම්ප්‍රදායික කුල ක්‍රමය වෙනුවට පන්ති ස්තරායන ක්‍රමයක් බිහිවීම මෙම ඉංග්‍රීසි අධ්‍යාපනයේ ප්‍රතිඵලයක් විය.

ඓතිහාසිකව නූතනත්ව ක්‍රියාවලිය මතුවන්නේ නාගරීකරණය හා කාර්මීකරණ ක්‍රියාවලිය සමගය. පසුකාලීනව නවීකරණය විසින් දේශපාලන ක්‍රමයේ ද වෙනස්කම් ඇති කරනු ලැබිණ. මෙම නව දේශපාලන ක්‍රමය සාම්ප්‍රදායික දේශපාලන ක්‍රමයෙන් ඉඳුරාම වෙනස් විය **(ද සිල්වා, අත්තනායක, 2016:27)**. මෙරට නව පරිපාලන යාන්ත්‍රණයක් නැතහොත් නිලධාරි ක්‍රමයක් ද හඳුන්වා දෙන ලද්දේ ඉංග්‍රීසීන් විසිනි. සුදුසුකම් මත නිලධාරීන් පත් කරමින් මෙරට සිවිල් සේවයක් ආරම්භ කළ අතර ඒ මගින් නව සංවිධාන සංස්කෘතියක් ද ඇති කරන ලදි. මෙසේ අභිනවයෙන් බිහි වී ව්‍යාප්ත වී ගිය නිලධාරි යන්ත්‍රණය මෙරට පරිපාලන නවීකරණයේ ලක්ෂණයක් විය. මෙසේ ආර්ථික, දේශපාලන, අධ්‍යාපනික හා පරිපාලන ක්ෂේත්‍රවල එතෙක් ක්‍රියාත්මක වූ සාම්ප්‍රදායික අනන්‍යතා බිඳවැටීමත්, මෙරට සමාජය නූතනත්වයට පත්වීමත් යටත්විජිත යුගයෙහි දී සිදු විය. එනම් ප්‍රධාන වශයෙන් 1833 කෝල්බෲක් කැමරන් ප්‍රතිසංස්කරණත් සමගිනි. ඒ අනුව මෙසේ නව්‍යත්වය පිළිබඳ අදහස් සහ එහි ලක්ෂණ ලාංකේය සමාජයට ප්‍රවිෂ්ට වීම නූතන සිංහල සාහිත්‍යයෙහි ප්‍රභවය ඇතිවීමට මෙන්ම පූර්ව යටත්විජිත යුගයේ මෙරට බිහි වූ කතා කලාව නව්‍ය දිශානතියක් ඔස්සේ වර්ධනය වීමට ද හේතු විය. ඒ අනුව විඥානවාදී ලෝක දෘෂ්ටියක සීමා අතික්‍රමණයෙහි අපොහොසත් වූ නිර්මාණාත්මක සාහිත්‍යය, පුද්ගල හා සමාජ අත්දැකීම් විෂය කොටගත් අභිනව පරාසයක ප්‍රවේශයන් වෙත විතැන් වන්නට විය. එහි ප්‍රතිඵලයක් ලෙස අභිනව සාහිත්‍යාංගයක් ලෙස බිහි වූ සිංහල ප්‍රබන්ධ කතාව තත්කාලීන සමාජ ජීවිතය හා සම්බන්ධ අනුභූතීන් විෂය කොට ගනිමින් යථාර්තවාදී සාහිත්‍ය යුගයක ආරම්භය සලකුණු කිරීමෙහි සමත් විය.

**සාකච්ඡාව :**

යටත්විජිත යුගයෙහි සිදු වූ සමාජාර්ථික පරිවර්තනයත් සමගම විශේෂයෙන් 1833 කෝල්බෲක් ප්‍රතිසංස්කරණවල ප්‍රතිඵල ලෙස රාජකාරි ක්‍රමය අහෝසි කිරීම හේතුවෙන් රාජ්‍යත්වය සතු වූ ආර්ථික ඒකාධිකාරිය අභියෝගයට ලක් විය. එමෙන්ම කුල නැතහොත් ශිල්ප ශ්‍රේණි මත පදනම්ව ක්‍රියාත්මක වූ පාරම්පරික වෘත්තීය තත්ව විස්ථාපනය විය. හුවමාරු ආර්ථිකය වෙනුවට මුදල කේන්ද්‍ර කොට

ගත් අර්ථ ක්‍රමයක් ආදේශ විය. මේ නව අර්ථ ක්‍රමයෙහි ඵලදායි සාමාජිකයන් වීමට ප්‍රවේශ මාර්ග ද්වයකි. එනම් නව අධ්‍යාපන ක්‍රමය මගින් ලබා ගත හැකි රැකියා අවස්ථා වෙත එළැඹීමෙන් ලබන ආර්ථික ශක්තිය මෙන්ම වතු වගා / වැවිලි ආර්ථිකයෙන් හෝ අරක්කු රේන්ද හෝ මිනිරන් පතල් වැනි අභිනව ආර්ථික උත්පාදන මාර්ගවලින් ලබන ව්‍යාපාරික අවස්ථා වශයෙනි. නූතන ප්‍රබන්ධකරුවා මෙම නව ආර්ථික තත්වය අඩු වැඩි වශයෙන් ප්‍රතිනිර්මාණය කොට ඇති ආකාරය හඳුනාගත හැකිය. මෙම ප්‍රබන්ධවල සුලබ වශයෙන් හමුවන ප්‍රධාන චරිත අධ්‍යාපනයෙන් හෝ ව්‍යාපාර මගින් ඉහළ ආර්ථික තත්වයක් වෙත ප්‍රවේශ වූ පුද්ගලයෝ වෙති.

1923 රචිත **බද්ධ වෛරය හෙවත් නැන්දා සහ ලේලි** නම් ප්‍රබන්ධයෙහි යටත්විජිත අධ්‍යාපනයෙහි ඵල ලබා ඉහළ රැකියාවක් වෙත එළැඹි හැරී නම් තරුණයකු නිරූපණය කෙරෙයි. අවසාන විභාගයෙන් සමර්ථ වූ තරුණ නීතිඥයකු වූ ඔහු ධනවතෙකි. ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයෙක් මෙන් දිවුරා කොළඹ උසාවියේ කටයුතු කරන්නට පටන් ගත්තේය **(ජිනදාස, 1923 : 73).**

මාර්ටින් වික්‍රමසිංහගේ **මිරිඟුවේ** නිරූපිත 'විජිත මනුවරණ' නම් තරුණයා එංගලන්තයට ගොස් බැරිස්ටර් විභාගය සමත් වී පැමිණියෙකි. 'ලැවිසන් නීලකාන්ත' ද එම විභාගය සමත් කොට එංගලන්තයේ වසර හතරක් වාසය කොට පැමිණියෙකි. 'පෝල් කළුමැදිරිය' ද පෙරකදෝරු විභාගය සමත් වූවෙකි **(වික්‍රමසිංහ, 1925 : 31, 54, රණසිංහ 1924 : 12, ගුණරත්න 1919 : 20).**

ඉංග්‍රීසිය මාධ්‍ය කොට ගත් නව අධ්‍යාපන ක්‍රමය නූතන සමාජය වෙත ජනතාව ප්‍රවේශ කිරීමෙහි සමත් විය. විවිධ වෘත්තීන් ඉලක්ක කොටගත් අධ්‍යාපනය, නාගරීකරණය වූ ග්‍රාමීය පහළ මධ්‍යම පාන්තික තරුණයන් වඩා ඉහළ රැකියා හා සමාජ තත්ව වෙත මෙහෙයවීමෙහි සමත් වූ ආකාරය 1924 ඩබ්ලිව්.ඒ. සිල්වාගේ **පාසල් ගුරුවරී** ප්‍රබන්ධයෙහි දක්වේ. බැනට් නම් මේ තරුණයා නගරයට පැමිණ තාවකාලික රැකියාවන්හි යෙදෙමින් දැඩි උත්සාහයෙන් නීතිය හැදෑරීමෙන් නවීන සමාජයේ සාමාජිකයෙකු බවට පත් වූයේය.

> ''බැනට් අල්විස් දන් මුළු ලක පතළ ප්‍රසිද්ධියක් ඇති මහතෙකි. පරාර්ථකාමී ජාති හිතෛෂියෙකු වශයෙන් ද විශාරද

නීතිවේදියෙකු වශයෙන් ද ජීවිතය ආරම්භ කළ ඔහුට ස්වකීය උද්යෝගිමත් භාවය නිසා මඳ කලකින්ම ධනය ගං වතුරක් සේ මෙන් ගලන්නට පටන් ගත්තේය'' **(සිල්වා 1924 : 153).**

වික්‍රමසිංහගේ **සෝමා** (1922) ප්‍රබන්ධයෙහි ද දක්වෙන පරිදි තරුණයන් වඩාත් උනන්දුවෙන් නව අධ්‍යාපන ක්‍රමය ඔස්සේ රැකියා වෙත එළැඹීමට උත්සුක විය.

''කොළඹ ශාස්ත්‍රෝද්ග්‍රහණය කරමින් සිටි ඇඩ්මන්ඩ් සහ පීටර් යන දෙදෙනාම නීතිඥ විභාගයෙන් එක්වර සමර්ථ වූහ...'' **(වික්‍රමසිංහ 1922:).**

පූර්ව නූතන සමාජයේ / පූර්ව යටත්විජිත සමාජයේ විවාහය සම්බන්ධයෙන් පවුල් අතර ගැළපීම සිදු වූයේ 'කුලය' හෝ 'වංශය' මූලික කොට ගැනීමෙනි. එහෙත් නූතන ධනේශ්වර සමාජයේ සිදු වන්නේ හුදෙක් මූල්‍ය පදනම මතයි.

''... ඒ කොයි හැටි වුවත් අපගේ දියණිය අප විසින් ධනවතකුගේ පුත්‍රයකුට විනා අන්‍යයකුට පාවාදීම නොසෑහෙන්නේය. දුප්පත් අයෙක් අප වැනි පොහොසත් පවුලකට ඇතුළත් උනාම ඔහුගේ හිරිහැර කරදර ලැබීම සත්‍යය'' **(පෙරේරා 1908 : 11).**

අභිනව සමාජාර්ථික ක්‍රමයට අනුගත වෙමින් ජීවිකාව උදෙසා නගර වෙත සංක්‍රමණය වීමෙහි උත්තේජනයක් වූ වැටුප් ක්‍රමය යටත්විජිත යුගයෙහි මෙරට නාගරික සමාජයෙහි පීඩිත පන්තියක් නිර්මාණය කිරීමෙහි හේතු විය. සාම්ප්‍රදායික නිෂ්පාදන ක්‍රමයේ සිට නූතන ක්‍රමයට විතැන්වීමේ ක්‍රියාවලියේ දී භූගෝලීය කලාපයක් මුහුණදෙන ප්‍රධාන ගැටලුවලින් එකක් වන්නේ මෙකී අභ්‍යන්තර සංක්‍රමණයයි **(International Journal of Economics & Business Administration, Vol. I Issue (4) 2013:27-30).** කිසියම් සමාජයක් නූතනත්වයට පත්වීමේ දී කාර්මීකරණය, නවීකරණය හා නාගරීකරණය යන සංයුක්ත සංකීර්ණ ක්‍රියාවලිය හේතුවෙන් තත් සමාජයේ ආන්තීකරණයට ලක් වූ වැටුප් ශ්‍රමිකයන් පිරිසක් බිහිවීම අනිවාර්ය තත්වයකි. මේ පසුබිම සිංහල ප්‍රබන්ධ රචකයන්ගේ නිර්මාණ ඇසුරෙන් ප්‍රකට වීම මගින් සාහිත්‍යය යනු එය පහළ වන යුගයෙහි ප්‍රතිබිම්බයකි යන ප්‍රවාදය සනාථ කිරීමෙහි හේතු වෙයි.

ඇන්.ජී. විමලනාථ විසින් රචිත **තරුණියකගේ අන්තිම කැමැත්ත නොහොත් සෝමාවතී** (1918) ප්‍රබන්ධයෙහි 'විල්මට්' නම් තරුණයා කොළඹ මරියකඩේ යෝනක සාප්පුවක සපත්තු මහන්නෙකු ලෙස ජීවිකාව පවත්වාගෙන ගියේය. එහිම නිරූපිත චාර්ල්ස් නම් තරුණයා පිටකොටුවේ වෙළෙඳ ශාලාවක ගණන් තැබීමේ නියුතු වූවෙකි **(විමලනාථ 1918 : 28).**

මරදාන ඕඩේ පාරේ පදිංචි ජොහානා සහ ඇයගේ දියණිය සුසී පවුල රක්ෂා කිරීම සඳහා පහළ පන්තියේ ඇඳුම් මැසීමෙහි නිරත වූහ. සුළු මැහුම් වැඩ කොට ඒවා පිටකොටුවේ ඇඳුම් විකුණන වෙළෙන්දියන්ට විකිණීම ඔවුන්ගේ රැකියාවයි **(ජිනදාස 1923 : 33).**

**මිරිඟුව** කෘතියෙහි නිරූපිත කුලී රික්ෂෝ රථ රියදුරෙකි. ඔහුගේ චරිත නිරූපණය මගින් පීඩිත පාංතික ජනයාගේ අස්ථාවර ආර්ථික තත්වය මෙන්ම ඒ හා සමගම වර්ධනය වන පීඩිත පාංතික සමාජ සංස්කෘතික පසුබිම ද මේ මගින් ප්‍රතිනිර්මාණය කෙරේ. දිළිඳු බවේ විෂම චක්‍රය හේතුවෙන් ආර්ථික පීඩාවෙන් මිදීමෙහි අපොහොසත් මෙම සමාජ කොට්ඨාසය ධනේශ්වරයේ අනිවාර්ය ප්‍රතිඵල ලෙස හැඳින්වේ.

> ''දවසකට උඹ කීයක් හම්බ කරනවද?
>
> මොනවද මහත්තයා ඒකෙ ගානක් නෑ. සමහර දවසට රුපියල් හතක් හම්බ කරනවා. සමහර දවසට සත හැත්තෑපහක් හම්බ කරනවා. මම දවසට සහ හැත්තෑ පහක අරක්කු බොනවා.
>
> ....................
>
> බීම හරිගස්සල තියෙන්නේ මේ රස්සා කරන අපට තමා'' **(වික්‍රමසිංහ 1925 : 122-123).**

පියදාස සිරිසේනගේ **මහාවියවුල** ප්‍රබන්ධයෙහි ද මරදාන ඩීන්ස් රෝඩ් නමැති වීදියේ පුංචි කුලී ගෙයක සිටිමින් කුලී වැඩ කර දිවි රැකගත් මවක හා දියණියක නිරූපිතය. නව ආර්ථික ක්‍රමය හේතුවෙන් ඇති වූ නව රැකියා මෙන්ම නාගරීකරණය වැනි නූතනත්වයේ අනිවාර්ය තත්වයන් හේතුවෙන් සමාජය පැහැදිලි ලෙස ප්‍රතිස්තරගත වීමත් ඒ අනුව නව සමාජයේ අඩු ආදායම්ලාභී පීඩිත පාංතික වැටුප්

ශ්‍රමිකයන් පිරිසක් බිහිවීමත් කැපී පෙනුණි **(සිරිසේන 1909 : 54).**

මෙරට නූතනත්වයට ප්‍රවිෂ්ටවීමත් සමගම සාම්ප්‍රදායික අර්ථ ක්‍රමයට සාපේක්ෂව සමාජ-සංස්කෘතික තත්වයෙහි ඇති වූ විපරිවර්තන ද පුද්ගල ගනුදෙනු ඇසුරෙන් ප්‍රකාශයට පත්වන්නට විය. ඒ අනුව බටහිර සමාජය අනුදත් සංස්කෘතික අගයන් එනම් එකී සමාජයෙහි ක්‍රියාත්මක විවිධ වෘත්තීන්, සිරිත් විරිත්, ඇඳුම් පැළඳුම්, කෑම බීම් ආදිය ද මෙරට ජන ජීවිතයට ආරෝපණය වන්නට විය.

''අපේ පිටිසර ගම්වලට නාකි වල් ගෑනු ගොහින් දුප්පත් ගෙදරවල ඉන්නා අහිංසක තරුණියන්ට හොඳ රැකී රක්ෂා අරගෙන දෙන්නටය. කියා එක්කරගෙන අවුත් වල් ස්ත්‍රීන්ගේ සමාගම්වලටත් යෝනකාදීන්ගේ ගේවලටත් දාස මෙහෙයට පමුණුවති. මේ නිසා කෙතරම් අසරණ දෙමාපියෝවත් කොළඹ ආදී එළිමහන්වල රැකී රක්ෂා ආදියත් පිණිස ගෑනු දරුවන් නොයැවීමට තරයේ සිතට ගත යුත්තාහ'' **(සිරිසේන 1921:224).**

ලාංකේය සමාජය නූතනත්වයට ප්‍රවිෂ්ට වූ යටත්විජිත යුගයෙහි දී මෙරට පූර්ණ වශයෙන් බ්‍රිතාන්‍ය යටත්විජිතයක් වීම හේතුවෙන් එතෙක් පෘතුගීසි හා ලන්දේසින් ඇසුරෙහි සිදු වූ සංස්කෘතික සම්මිශ්‍රණය කරන කොටගෙන මෙරට සමාජයෙහි ප්‍රකට වූ දෙමුහුන් ස්වරූපය පරිපාකයට පත් විය. නිල බලය මගින්ම මෙරට සමාජයට අන්තර්ග්‍රහණය වූ දේ මෙන්ම බහු සංස්කෘතික සමාජ ක්‍රියාකාරීත්වය හේතුවෙන් නිරුත්සාහකවම ප්‍රකාශයට පත් වූ ඇවතුම් පැවතුම් හෝ සිරිත් විරිත් ආදිය නූතනත්වයේ තවත් ස්වරූපයක් වූ දෙමුහුන් (Hybridity) ලක්ෂණ ප්‍රකට කිරීමෙහි සමත් වූ ආකාරය **වලව්වක පලහිලව්ව** ප්‍රබන්ධය මගින් එසේ ප්‍රකාශයට පත් වේ.

නව අධ්‍යාපන ක්‍රමයෙහි ඵල ලැබූවන් ලෙස ලැබූ රැකීරක්ෂා මෙන්ම අධ්‍යාපනය නොලැබූවන්ගෙන් යුතු වූ වැටුප් ශ්‍රමිකයන් ද මෙසේ නූතනත්වයට පිවිසි ලාංකේය සමාජයේ නව සාමාජිකයෝ වූහ. මෙයට අමතරව තත්කාලීන සමාජය නියෝජනය කළ ව්‍යාපාරික ප්‍රජාව ද මෙරට නව ආර්ථිකයේ තීරණාත්මක සාධකයක් විය. ලාංකේය සමාජය නූතනත්වයට එළැඹීමේ ආර්ථික මෙන්ම සමාජ ප්‍රකාශනයෙහිලා කැපී පෙනෙන ප්‍රජාව වූයේ ද මේ පිරිසයි. නූතන සිංහල ප්‍රබන්ධ සාහිත්‍යයෙහි ආරම්භක යුගයෙහි එනම් වසර

විසිපහක් පමණ වන ඉතිහාසයෙහි ප්‍රකාශිත ප්‍රබන්ධ අතර පියදාස සිරිසේන, මාර්ටින් වික්‍රමසිංහ, ඩබ්ලිව්.ඒ. සිල්වා, සයිමන් ද සිල්වා, එම්.සී.එෆ්. පෙරේරා සහ ඇල්බට් සිල්වා වැනි මහා සාහිත්‍යයෙහි නියෝජිතයන් මෙන්ම චූල නිර්මාණකරුවන්ගේ ද ප්‍රබන්ධගත ප්‍රධාන කතා පුවත නැතහොත් මුඛ්‍ය චරිත මෙම නව ධනේශ්වර සමාජ පන්තිය නියෝජනය කරන තත්කාලීන සමාජ කොට්ඨාසය වටා ගොඩනැගුණකි. මේ අනුව ප්‍රබන්ධගත සමාජ යථාර්ථ ගවේෂණයෙහි දී කැපී පෙනුණු ලක්ෂණයක් වූයේ පූර්ව යටත්විජිත යුගයෙහි මෙරට බහුතරයකගේ ජීවනෝපාය වූ වී ගොවිතැන හෝ හේන් ගොවිතැන විෂය කොටගත් ප්‍රබන්ධ මෙම අධ්‍යයනය සඳහා භාවිත ප්‍රාථමික මූලාශ්‍රය අතර අතිශය විරල විය. මේ මගින් ද සනාථ වන්නේ නූතන ප්‍රබන්ධ වනාහී ඒවා බිහිවන යුගයෙහි පර්යාවලෝකනයක්ය යන සමාජීය සාහිත්‍ය අධ්‍යයන න්‍යායගත යථාර්ථය සිංහල ප්‍රබන්ධ සාහිත්‍ය විමසීමෙන් ද සනාථ කෙරෙන බවයි. එනම් තත්කාලීන සමාජය අත්විඳි නූතනත්වයෙහි විවිධ ස්වරූප සම්බන්ධයෙන් සමකාලීන ප්‍රබන්ධකරුවා සවිඥානික වූ බවයි. ඒ අනුව සමස්තයක් ලෙස මෙම ප්‍රබන්ධවල පවුලෙහි ප්‍රධානියා ආර්ථික වශයෙන් සශ්‍රීක වූවෙකි. මුහන්දිරම්වරු, නොතාරිස්වරු, වාසල මුදලිවරු, මහාපරිමාණ මිනිරන් වෙළෙන්දෝ, විදානේවරු, වතු කොන්දොස්තරවරු, දිසා මහත්තුරු, ශල්‍ය වෛද්‍යවරු, නීතිඥයෝ, අධිනීතිඥයෝ, දිසාපතිවරු, ගුරුවරු, ධනවත් රේන්දකරුවෝ, ලිපිකරුවෝ මෙන්ම ග්‍රාමීය ඉඩම් හිමි ධනවත්තු මේ අතර වෙති.

යටත්විජිත යුගයෙහි ආරම්භක කාල වකවානුවෙහි එක්රැස් කරගත් ප්‍රාග්ධන සමුච්චය පසුකාලීනව නැගී ආ වතු වගා ක්ෂේත්‍රයෙහි ආයෝජනය කිරීම මගින් ධනවත් ව්‍යාපාරික පිරිසක් බිහි වූහ. ඔවුහු අරක්කු රේන්ද ව්‍යාපාරය, මිනිරන් ව්‍යාපාරය, වෙළෙඳාම ආදියෙන් රැස් කරගත් මූලධනය තේ, කෝපි, රබර් වැනි මහාපරිමාණ වාණිජ වගාවන්හි යෙදවූහ. සිරිමැදුර ප්‍රබන්ධයෙහි නිරූපිත වින්සන්ට් නම් තරුණයාගේ පියා මිනිරන් කර්මාන්තය ඇසුරෙන් ධනවත් වූවෙකි. ඔහුගෙන් පසු පුතා පියාගේ ව්‍යාපාර කටයුතු පවත්වාගෙන ගිය අතර මුල් පරම්පරාවට සාපේක්ෂව කිසියම් අධ්‍යාපනයක් ලබා ව්‍යාපාර ඥානයකින් සමන්විතව ක්ෂේත්‍රයට පිවිසීම දැකගත හැකිය **(පෙරේරා 1908 : 98).**

**මගේ කරුමේ** (1907) ප්‍රබන්ධයෙහි නිරූපිත තියෝබෝල්ඩ් ප්‍රනාන්දු නම් තරුණයා මිනිරන් වෙළඳාමෙන් ඉතා ධනවත් වූවෙකි. නූතන ලාංකේය සමාජයෙහි ව්‍යාපාරික ධනවතුන් ආරම්භක වශයෙන් ආදායම් උපයන ලද්දේ අරක්කු රේන්ද ව්‍යාපාරවලින් හෝ මිනිරන් කර්මාන්තය වැනි මාර්ගවලිනි. අනතුරුව ලක්දිව නොයෙක් පළාත්වල ඉඩකඩම් හා දේපළ මිලට ගත්තේය **(පෙරේරා 1907:18).** මිනිරන් වෙළෙඳාමෙන් ධනවත් වූ පීරිස් නමැත්තා අගනුවර වාසයට පැමිණීමත් නූතනත්වයෙහි සංස්කෘතික ප්‍රකාශන වන බටහිර සමාජ අගයන් අන්තර්ග්‍රහණයෙහි උත්සුක වූ ආකාරය නූතන ප්‍රබන්ධ ඇසුරෙන් හඳුනාගත හැකිය. ඒ අනුව ක්‍රමයෙන් නූතනත්වයට ප්‍රවිෂ්ට වන ලාංකේය සමාජයේ ආර්ථික පරිවර්තනයත් ඒ මත පදනම් වන ධනේශ්වර සමාජ ක්‍රමයෙහි තත්ව සහ බල නිර්මාණයත් පිළිබඳ සවිඥානක වූත් එකී යථාර්ථය ප්‍රතිනිර්මාණයෙහි සමත් වූත් ප්‍රබන්ධකරුවෝ වෙති.

> ''... බම්බලපිටියේ 'බෙන් ඊඩන්' නම් ගෘහයට ගෘහස්ත මෙහෙකරුවන් උවමනා බව දැනගන්නට ලැබී ඒබ්‍රහම් පෙරේරා එහි පැමිණ හිල්ඩාට එහි රක්ෂාව ලබා දුන්නේය. පීරිස් නම් ධනවත් මිනිරන් වෙළෙන්දෙක් ඒ ගෙදර වාසය කළේය. ඔහුට ඇති වූයේ මැටිල්ඩා නම් එකම දූ කෙනෙක් පමණකි. පීරිස් මහතා අළුත පොහොසත් වූ කෙනෙක් බැවින් කුලඟනක් මෙන් ඈ ඇතිදැඩි කිරීමට  බොහෝ ව්‍යායාම දැරීය. ඈට පියානෝ ගැහීමත් නැටීමත් උගන්වන පිණිස ලන්සි නෝනා කෙනෙකු ගෙදරට ගෙන්වා ගත්තේය... සවස් භාගයේ ව්‍යායාම පිණිස ඇවිදීමට ලක්ෂණ පෝනියෙකු සහිත  අශ්වරථයක් සාදවා දුන්නේය...'' **(කුරුකුලසූරිය 1924 : 28-29).**

ආරියවංශ අභයරත්නගේ **ශ්‍රී කාන්තා ශ්‍රී හෙවත් ලිලීගේ සැබෑ ප්‍රේමය** (1916) කෘතිය ද නැගී එන ධනේශ්වරය, නාගරීකරණය ඇතුළු නූතනත්වයට පිවිස අභිනව සමාජයේ ස්වභාවය ප්‍රකට කරන්නකි. නූතනත්වයෙහි සංස්කෘතික සම්ප්‍රේෂණ ක්‍රියාවලියෙහි දී ඉංග්‍රීසි අධ්‍යාපනය මෙන්ම ඒ හා සම්බන්ධ සමාජානුයෝජනය කෘත්‍යයන් පිළිබඳ වූ යථාර්ථය ද කතුවරයාගේ අවධානයට ලක් වී තිබේ.

''ඇල්ප්‍රඩ් පෙරේරා වනාහී ඉතා දුප්පතෙක්ව සිට මිනිරන් වෙළඳාම හේතු කොටගෙන අලුත ධනවත් භාවයට පැමිණි ලොකු පොහොසතෙකි. ... ඉංග්‍රීසි කථාව සහ යුරෝපීය සිරිත් විරිත් හොඳට පුරුදු පුහුණු වීමත් සඳහා ලංසි ගෙදරක නවත්වමු යැයි කියා දෙමහල්ලන් විසින් කතා කරගෙන සෞසා නම් ලංසි මහතෙකුගේ ගෙදර නවත්වා...'' **(අභයරත්න 1916 : 8, 10).**

නූතනත්වයෙහි අනිවාර්ය අංගයක් වූ සන්නිවේදන දියුණුව විසින් පූර්ව යටත්විජිත යුගයෙහි මෙරට පැවති පුද්ගල දූරස්තභාවයෙහි සීමා පටු කරන ලදි. එය ධනාත්මක සමාජ අත්පත්කර ගැනීමක් වූවා සේම පෞද්ගලික ජීවන විෂයයෙහි ඇතැම් විට නුහුරු කරදරකාරී විවෘතභාවයක් ඇති කිරීමෙහි හේතු වූ ආකාරය ප්‍රබන්ධගත නිදසුන් ඇසුරින් සනාථ කෙරේ.

''... මෙහෙ නැතිවුන හැටියේ මොවුන් කලබොල වී එහාටත් මෙහාටත් දන්වනවා. එතකොට දෙපැත්තටම දැනෙනවා. මේ තැපැල් කන්තෝරුයි, ටෙලිග්‍රෑම් කම්බියි මළහත් ඉලව්වේ ඉංග්‍රීසිකාරයා ඇටෙව්වැන් රහසක්වත් කරගන්ට හැටියක් නෑ'' **(මාරසිංහ 1923 : 60).**

නව රැකියා උත්පාදන මාර්ග බිහි කරමින් ගොඩනැගුණු සව සමාජයේ නව සන්නිවේදන ක්‍රියාවලිය ඩබ්ලිව්.ඒ. සිල්වා ප්‍රතිනිර්මාණයට හසුවන්නේ මෙසේය.

''... මහ තැපැල් කන්තෝරුවට පියොන්ලා ඕනෑ කර තිබෙනවාය කියා මට ආරංචියි. මහත්මයා උදව් කළොත්, මට ඒ රක්ෂාවක් ගන්නට පුළුවනැයි කියා...'' **(සිල්වා 1903 : 105).**

කාර්මික දියුණුවට අවශ්‍ය යටිතල පහසුකම් අතර අත්‍යවශ්‍ය වූ විදුලිබල උත්පාදනයෙහි ප්‍රතිඵල ලෙස පොදු ජීවන අවශ්‍යතා පූරණයට විදුපහන් බල සම්පාදනය ද නූතනත්වයෙහි සංඝටක අතර වේ. මේ තත්වය ප්‍රබන්ධකරුවකුගේ අවධානයට ලක් වූයේ මෙසේය.

''කුරුඳුවත්තේ වරව් රෝඩ්හි පිහිටි 'සුමනගිරි' නම් දෙමහල් පහය වෙනදාට වැඩි දීප්තිමත් ආකාරයක් ඉසිලීය. එහි තණ්හි තණ්හි දල්වන ලද 'ඉලැක්ට්රික්' පහන් ආලෝකය කරණ කොට

ගෙන ප්‍රාසාදය පමණක් නෙව ඒ අවට ප්‍රදේශය ද ඒකාලෝක විය'' **(කනකරත්න 1921 : 08).**

නූතනත්වය හා සබැඳි නාගරීකරණය කොළඹ නගරය කේන්ද්‍ර කොට ගනිමින් ක්‍රමයෙන් ආසන්න උපනගර වෙත ද ප්‍රවිශ්ට වූ ආකාරය තත්කාලීන ප්‍රබන්ධකරුවාට විෂය වූයේ මෙසේය.

> ''විජේසේකර නෝනා, ඈ සේම තරුණ වයස් ඇති, ඈ සේම සිතූ යමක් කරන, සෙල්ලමෙහි නිතර සිත රැඳි, ඇඳුම් පැලඳුම් ගැන ආසාවෙන් ක්‍රියා කරන තැනැත්තියකි. ඇගේ ස්වාමිපුරුෂයා ද ඈ සේම කල්පනා ඇතිවූයෙන් ඇගේ අහංකාරය දියුණු කිරීමට ඔහු බොහෝ සෙයින් උපකාර වූයේය. එහෙයින් අලංකාර ලෙස ගේදොර තබාගෙන, වැඩකරුවන් රාශියක් ඇතිව, රථවාහන කීපයක් ද අශ්වයන් දෙදෙනෙක් ද ඇතිව සැප ඉසුරු දක්වමින් ඔව්හු කල්ගත කළාහුය'' **(ද සිල්වා 1907:50).**

ඕනෑම සමාජයක පළමුව නූතනත්වය අත්විඳින්නේ පරිපාලක මෙන්ම ආර්ථිකය කේන්ද්‍රගත වන භූගෝලීය වපසරියයි. ඊට අවශේෂ වශයෙන් ක්‍රමයෙන් නගර උපනගර හරහා සමාජ පරිධිය දක්වා එය ප්‍රසාරණය වේ. මෙහි ප්‍රතිඵලයක් ලෙස ක්‍රමයෙන් බිහිවුණු මෙරට මධ්‍යම පන්තිය මෙන්ම ඔවුන්ගේ කුටුම්බගත ජීවිතවල නව්‍ය ස්වරූපයත් දියුණු ප්‍රවාහන කටයුතු හා පෞද්ගලික සුඛවිහරණය කෙරෙහි නූතන සමාජය වෙත වූ ආකර්ෂණයත් මේ මගින් ප්‍රකාශයට පත් වේ.

> ''අද්වකාත් ඩෝසන් පොක්ස් මහතා මනාල දෙපළගේ සැප ප්‍රාර්ථනා සව්දිය පිරුවේය. මනාලයාගේ යාලුවා මෙන්... රැස් වූ සියලු දෙනා අලංකාර ශාලාවේ පිළියෙළ කර තිබූ සැන්ඩ්විච්, පස්තෑල ආදිය කමින් බ්‍රැන්ඩි, විස්කි ආදිය බොමින්... රැස්ව හුන් ජනයාගේ ඡායාරූප ගනු ලැබීය... එදින ප්‍රවෘත්ති පත්‍රවල මෙම විවාහ මංගල්‍ය සම්බන්ධ විස්තර ප්‍රවෘත්ති පත්‍රවල පළ වීය'' **(පෙරේරා 1911:19-22).**

මාර්ටින් වික්‍රමසිංහ විසින් රචිත **ලීලා** (1914) නවකතාවෙහි දැක්වෙන පරිදි ගමේ පන්සලට පැමිණෙන ගැමි ස්ත්‍රීන්ගේ කබාකුරුත්තුවල සහ හැට්ටවල මසා තිබුණු ඉංග්‍රීසි අකුරු, අභිනව

සමාජාර්ථික පරිවර්තනයෙහි සංකේත වේ. ඒවා සංඥාමය කියැවීමකට ද ලක් කළ හැකි වෙයි. ඉහළ සමාජාර්ථික තත්ව නියෝජනය කරන තරුණියන්ගේ එවැනි අනුකාරක තත්ව විටෙක සැලකිය යුතු අධ්‍යාපනයක් නොලද ගැමි තරුණියන්ගේ විවේචනයට ලක් වේ. ඓතිහාසිකත්වය විසින් තීරණය කළ මෙවැනි සමාජාර්ථික පරිවර්තන මගින් ස්ත්‍රිය විසින් වෙනසක් සඳහා ස්වකීය චින්තනය යොමු කරන ලද බව ප්‍රතිනිර්මාණය කරයි. යටත්විජිත යුගයේ විවර වූ අධ්‍යාපන වරප්‍රසාද මෙන්ම සංස්කෘතික දෙමුහුන්බව හෝ බහුසංස්කෘතිකත්වය අබියස නූතනත්වයට පිවිසි ලාංකේය ස්ත්‍රියගේ සමාජ ගතිකයන් මේ මගින් ප්‍රකාශයට පත් කෙරේ. ඒ අනුව ලීලා නවකතාවෙහි ස්ත්‍රී චරිත ඓතිහාසිකත්වය ප්‍රතික්ෂේප නොකරන, එහෙත් නව්‍යත්වය වැළඳ ගන්නා තත්කාලීන ලාංකේය ස්ත්‍රිය පිළිබඳ යථාර්ථය පසක් කොට දීමෙහි සමත් වී තිබේ.

> ''උඹ ගියා නම් හිනාවෙලා මැරේවි. අර ලැටීගෙ හැට්ටෙ මැද්දේම ... ඉංග්‍රීසි අකුරු දෙකක් රතු නූලෙන් හා එයිට වැඩිය හොඳ වැඩේ වෙලේගෙදර ලිසීගේ කබාකරුත්තුව පිටිපස්සෙ ඉංග්‍රීසි අකුරු පෙළක් මහලා තිබුණා'' **(වික්‍රමසිංහ 1914 : 9-10).**

**නිගමනය :**

දහනව වන සියවසෙහි පමණ මෙරට සිදු වූ සමාජ විපරිවර්තනය හේතුවෙන් නවීකරණය, කාර්මීකරණය ඇතුළු ධනේශ්වර සමාජ සංස්ථාවලින් යුතු නූතනත්ව ප්‍රවේශය ඓතිහාසික සන්ධිස්ථානය විය. මෙම යුගය වඩාත් විශ්වසනීයත්වයෙන් මෙන්ම යථාර්ථවාදී ලෙස ප්‍රතිනිර්මාණය කිරීමට නූතන සාහිත්‍යාංගයක් වූ සිංහල ප්‍රබන්ධ කතාව සතු ශක්‍යතාව මෙහි දී විමසා බලනු ලැබිණි. නූතනත්ව ව්‍යාපෘතිය පිළිබඳ කුමනාකාර විවේචනවලින් යුක්ත වුවද තත්කාලීන සිංහල ප්‍රබන්ධ රචකයන් ලාංකේය සමාජය නූතනත්වයට ප්‍රවිෂ්ට වීම පිළිබඳ ස්වරූපය ස්වකීය ප්‍රබන්ධ මගින් වඩාත් යථාර්ථවාදී ලෙස ප්‍රතිනිර්මාණය කිරීමෙහිලා සමත් වූ ආකාරය නිරීක්ෂණය කළ හැකිය.

# ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

## ප්‍රාථමික මූලාශ්‍රය :


අභයරත්න, කේ.ඩී.ඒ. (1916). **ශ්‍රී කාන්ත ශ්‍රී.** කොළඹ:

ඔලිවර් බෘස් (1963). **ලංකාව කාර්මික රටක් කිරීම, 1916 සිට 1948 දක්වා කාලය තුළ පැවති මත හා ප්‍රතිපත්ති.** නූතන යුගය ශාස්ත්‍රීය ලිපි, පළවෙනි කාණ්ඩය, දෙහිවල : තිසර ප්‍රකාශකයෝ.

කනකරත්න, ඒ. ද එස්. 1920. **පියකරු ලිලියන් හෙවත් දියුණුවේ රහස.** ද්විතිය භාගය, කොළඹ : සිරි ලංකෝදය යන්ත්‍රාලය.

කුලසූරිය, ඩී.පී. 1924. **හිල්ඩා.** ප්‍රකාශනය සඳහන් නොවේ.

ජිනදාස, ඒ.ටී.සී. 1923. **බද්ධ වෛරය හෙවත් නැන්දා සහ ලේලි.** ප්‍රකාශනය සඳහන් නොවේ.

ද සිල්වා ඒ. සයිමන් 1907. **තෙරීසා.** කොළඹ : සිරි ලංකෝදය යන්ත්‍රාලය.

පෙරේරා, එම්.සී.එස්. 1911. **ලලිතා හෙවත් රත්න මාණික්‍යය.** කොළඹ : සිංහල මුද්‍රණාලය.

1908. **මගේ පෙම්බරී.** කොළඹ : සිංහල සමය මුද්‍රණාලය.

1907. **ලංකා අභිරහස්.** කොළඹ : සිංහල සමය මුද්‍රණාලය.

මාරසිංහ, ජේ.එම්. 1923. **ප්‍රථම ආලය හා අන්තිම ආලය.** ගම්පහ : ගාමිණී ප්‍රින්ටින් වර්ක්ස්.

වික්‍රමසිංහ, මාර්ටින් 1922. **සෝමා හෙවත් නොනැසෙන ආලය.** කොළඹ : ඇම්.ඩී. ගුණසේන සහ සමාගම.

1925. **මිරිඟුදිය.** ප්‍රකාශනය සඳහන් නොවේ.

1914. **ලීලා.** කොළඹ : විද්‍යාභූෂණ මුද්‍රණාලය.

විමලනාථ, එම්.ජී.ඒ. 1918. **තරුණියකගේ අන්තිම කැමැත්ත.** කොළඹ : විද්‍යාදර්ශ මුද්‍රණාලය.

සිරිසේන, පියදාස 1909. **මහාවියවුල.** ප්‍රකාශනය සඳහන් නොවේ.

1921. **වලව්වක පලහිලව්ව හෙවත් වික්‍රමපාලගේ තුන්වැනි වික්‍රමය.** ප්‍රකාශනය සඳහන් නොවේ.

සිල්වා, ඩබ්ලිව්.ඒ. 1924. **පාසැල් ගුරුවරී.** කොළඹ : එන්.ජේ. කුරේ සහ ප්‍රකාශකයෝ.

**ද්විතියික මූලාශ්‍රය :**

ආරියපාල, ඇම්.බී. (1962) 1996. **මධ්‍යකාලීන ලංකා සමාජය.** කොළඹ : ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

එල්ලාවල, හේම 1964. **පුරාතන ලංකාවේ සමාජ ඉතිහාසය.** කොළඹ : ලංකාණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව.

ජයවර්ධන, කුමාරි 2006. **සොක්කන් ලොක්කන් වූ වගයි.** ශ්‍රී ලංකාවේ යටත්විජිත ධනේශ්වරයේ නැගීම, කොළඹ : සමාජ විද්‍යාඥයින්ගේ සංගමය.

දෝෂි, එල්.එස්. 2016. **නූතනත්වය, පශ්චාත් නූතනත්වය සහ නව සමාජ න්‍යාය.** (පරි.) ප්‍රේමකුමාර ද සිල්වා, අබේරත්න අත්තනායක), කොළඹ : ෆාස්ට් පබ්ලිෂින් (ප්‍රයිවෙට් ලිමිටඩ්).

2007. **නූතනත්වය යනු කුමක්ද? සංවාද**, 27 කලාපය, කොළඹ : සමාජ විද්‍යාඥයින්ගේ සංගමය.

බණ්ඩාරගේ, අශෝකා 2005. **ශ්‍රී ලංකාවේ යටත්විජිතවාදය.** කොළඹ : ස්ටැම්ෆර්ඩ්ලේක්.

වික්‍රමසිංහ, නීරා 2012. **ශ්‍රී ලාංකේය ඉතිහාසය.** වෙළුම (සංස්.) විජේතුංග, ඩබ්ලිව්.එම්.කේ., කොළඹ : ඇම්.ඩී. ගුණසේන සහ සමාගම.

සුරවීර, ඒ.වී. 1982. **සමාජීය සාහිත්‍ය අධ්‍යයනය.** කොළඹ : සීමාසහිත ලේක්හවුස් ඉන්වෙස්ට්මන්ට්.

Andradi W.M.D.D. 2011. **Sri Lanka Subordinates of the British**. Colombo Social Scientists Association.

Bandarage, Asoka 1982. **Colonialism in Ceylon**. Colombo:

De Silva Colnin 1941.(1995) **Ceylon Under the British Occupation**. Vol. II, 1795-1833, New Delhi: ….. Publication.

Fernando, Tissa 1979 (ed.) **Politics and Modernizational Modern Sri Lanka** : Society in Transiation, USA, Syracuse University Press.

Giddens, Anthony 1998. **Capitalism & Modern Social Theory**' London: Cambridge Press.

Gunathilaka, Hema (?) **Kalyani Journal of Humanities & Social Sciences** of the University of Kelaniya.

Kearney, R. 1979. **Politics and Modernization in Modern Sri Lanka : Society in Transiation**.

Rustow, D.A. 1967. **A Word of National Problems of Political Modernization**. The Brooking Institute, Washington:

Thambiah, S.J. 1969. **Kingship, fact and fiction in relation to the Canedian Sinhalese**. Journal of the Royal Anthropological Institute, Volume V.

## Web-sites :

**https://www.tutorzu.net>sociology>topies> modernity** 2021.03.29.